# අධ්‍යාපන අමාත්‍යාංශය

## අංක අමප/21/0320/308/016 හා 2021.03.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම - 2021/2022

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I,II,III ශ්‍රේණිවල ඒකාබද්ධව පවතින පුරප්පාඩු 4718 ක් පිරවීම සඳහා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීම පිණිස, පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය වෙනුවෙන් අයදුම්පත් භාර ගනු ලැබේ. අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයට සම්පූර්ණ කර තිබිය යුතුය.

ජාතික පාසල්වල හා පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු 4718ක් සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් පහත පරිදි වේ.

| අනු අංකය | පළාත | සිංහල | දෙමළ | එකතුව |
|---|---|---|---|---|
| 1 | සබරගමුව | 649 | 135 | 784 |
| 2 | වයඹ | 527 | 137 | 664 |
| 3 | නැගෙනහිර | 97 | 526 | 623 |
| 4 | මධ්‍යම | 335 | 279 | 614 |
| 5 | ඌව | 376 | 87 | 463 |
| 6 | දකුණ | 494 | 32 | 526 |
| 7 | බස්නාහිර | 427 | 72 | 499 |
| 8 | උතුරු මැද | 275 | 40 | 315 |
| 9 | උතුර | 13 | 217 | 230 |
| | | 3193 | 1525 | 4718 |

මෙම නිවේදනයේ "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා විදුහල්පති සේවයයි. "ව්‍යවස්ථා සංග්‍රහය" යනුවෙන් අදහස් කරන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 සහ 2014.10.22 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයයි.

02. මෙම නිවේදනයේ අග දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිතව ලියාපදිංචි තැපෑලෙන් හා විද්‍යුත් තැපෑලෙන් යන දෙයාකාරයෙන්ම එවීම අනිවාර්ය වේ. අයදුම්පත් "සහකාර ලේකම් , විදුහල්පති ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල". යන ලිපිනයට 2022.01.26 වැනි දිනට හෝ එදිනට පෙර හෝ එවිය යුතුය. එමෙන්ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ සහිත ඉල්ලුම් පත්‍ර principalbranch2@gmail.com හා sasese.moe@gmail.com යන විද්‍යුත් ලිපිනයන් වෙත පමණක් 2022.01.26 වැනි දිනට හෝ එදිනට පෙර හෝ එවිය යුතුය. එසේ යොමු නොකරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබන්නේ නියමිත දිනට හෝ එදිනට පෙර විද්‍යුත් ලිපිනයන් වෙත හා ලියාපදිංචි තැපැල වෙත ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරනු ලබන අපේක්ෂකයින් සඳහා පමණි.

අයදුම්පත් බහාලන කවරයේ වම් පස ඉහළ කෙළවරේ "අංක අමප /21/0320/308/016 හා 2021.03.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය 2021/2022 " යන්න සඳහන් කළ යුතුය.

03. සේවා කොන්දේසි:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1885/31 සහ 2014.10.22 වැනි දින දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසි ද, එම ව්‍යවස්ථා සංග්‍රහයට මේවනවිට සිදු කර ඇති සංශෝධනද, මින් මතු කෙරෙන සංශෝධන වලටද, රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලටද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයකු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත්කරනු ලැබේ.

04. වැටුප් පරිමාණය: ජී.ඊ. -4-2016

රු. 35,280 - 7x680 - 6x825 - 11x1,335 - 14x1,650 – 82,775

05. සුදුසුකම්:

5.1 පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති සේවයේ ස්ථිර කරන ලද ශ්‍රී ලංකා ගුරු සේවයේ ගුරුවරු හා විදුහල්පති තනතුරේ වැඩ බලන /රාජකාරි ආවරණය කරන ගුරුවරු ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ලබති.

5.2 අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ජාතික අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් අධ්‍යාපනවේදී උපාධිය

හෝ

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ඕනෑම විෂය ක්ෂේත්‍රයක උපාධිය සමඟ පහත සඳහන් එක් හෝ සුදුසුකමක් ලබා තිබීම.

(අ) පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාව හෝ විෂය සංයුතියෙහි අධ්‍යාපන විෂයය පිළිබඳව අවම වශයෙන් 50%ක් අන්තර්ගත වන විෂයානුබද්ධ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමාවක්,

(ආ) ගුරු පුහුණු සහතිකය,

(ඇ) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව,

හෝ

(iii) ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව / ගුරු පුහුණු සහතිකය ලබා තිබීම.

<u>සටහන:-</u>

“ ගුරු පුහුණු සහතිකය” යනු අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දෙවසරකට නොඅඩු වූ ආයතනික ගුරු පුහුණු පාඨමාලාවක් හෝ අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත කරන ලද දුරස්ථ ක්‍රමය මඟින් හදාරන ලද තෙවසරකට නොඅඩු ගුරු පුහුණු පාඨමාලාවක් වේ.

5.3 පළපුරුද්ද:

(අ) ඉහත 5.2 (i) හෝ 5.2 (ii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම

හෝ

(ආ) ඉහත 5.2 (iii) සුදුසුකම් ලැබූ ශ්‍රී ලංකා ගුරු සේවයේ වසර හයක (06) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කල නිලධාරියකු වීම හා එම කාලය තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

5.4 කායික හා මානසික යෝග්‍යතාවය

සෑම අයදුම්කරුවෙක්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරී ඉටුකිරීමටත්, ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

සටහන : අයදුම්පත් කැඳවන අවසාන දිනට ඉහත සඳහන් පූර්වාසන්න සේවා කාලය තුළ සියළුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන නැත්තාවූද, මෙම කාලය තුළ කරන ලද වරදකට කිසියම් දඬුවමක් (අවවාද කිරීමක් හැර) ලබා ඇත්තාවූද නිලධාරියෙක් / නිලධාරිනියක් මෙම සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා සුදුසුකම් නොලබයි.

5.5 වෙනත් සුදුසුකම්

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
ii. ශ්‍රී ලංකා විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා පවත්වන තරඟ විභාගය සඳහා තුන් (03) වතාවකට වඩා පෙනී සිටීමට කිසිදු අපේක්ෂකයකුට අවසර නැත. නමුත් විදුහල්පති තනතුරක වැඩ බලන / රාජකාරි ආවරණය කරන නිලධාරීන් සඳහා පමණක් අංක අමප/21/0320/308/016 හා 2021.03.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයද ඇතුළත්ව අවස්ථා ගණන සිව් වතාවක් (04) ලෙස සලකනු ලැබේ.
iii. විදුහල්පති සේවයට බඳවා ගැනීම සඳහා වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සියළු සුදුසුකම් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
iv. ශ්‍රී ලංකා ගුරු සේවයේ ස්ථිර කර තිබිය යුතුය.
v. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 01/2020 අනුව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

5.6 වයස

උපරිම වයස 2022.01.26 දිනට අවුරුදු 50 විය යුතුය.

සටහන: අංක අමප/21/0320/308/016 හා 2021.03.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා ඇති පරිදි 2022.01.26 දිනට පූර්වාසන්න වසර 05ක කාලය තුළ විදුහල්පති තනතුරු වල වැඩ බැලීම/රාජකාරී ආවරණය කරන ලද නිලධාරීන් සඳහා උපරිම වයස් සීමාව 58 වේ. තවද, මෙම නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව සම්පූර්ණ කළ යුතු අනෙකුත් සියලු සුදුසුකම් 2022.01.26 දිනට සපුරා තිබිය යුතුය.

06. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

(i) අයදුම්කරු ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමට සුදුසුකම් ඇති මාධ්‍ය භාෂාවෙන්ම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර හා සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ඇත.

07. සාවද්‍ය තොරතුරු සැපයීම:

අයදුම්කරු සුදුසුකම් නොමැත්තෙක් බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කරනු ලැබ ඇති බව සනාථ වුවහොත් හෝ එසේ නැතහොත් යම් වැදගත් කරුණක් ඕනෑකමින් යටපත් කරනු ලැබ ඇති බව හෙළිදරව් වුවහොත් ඔහු/ඇය සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

08. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය හා බඳවා ගැනීමේ ක්‍රමවේදය

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය:-

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට අදාළ කර ගන්නා ලකුණු පටිපාටිය පහත දැක්වේ.

| ලකුණු පටිපාටිය | ලකුණු |
|---|---|
| 1. 2022.01.26 දිනට පූර්වාසන්න වසර 5 තුළ පළාත් බලධාරීන්ගේ විධිමත් පත්කිරීමේ ලිපිය / වැඩ භාරගත් ලොග් සටහන අනුව වැඩ බලන ලද හෝ වැඩ ආවරණ කාලය සඳහා (වර්ෂයකට ලකුණු 07 බැගින් උපරිමය වසර 05) | 35 |

සටහන:

i. වැඩ බලන විදුහල්පතිවරයෙකු ලෙස සේවය කරන කාලය සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශ හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය සහිතව සේවය සනාථ කිරීම සඳහා ලිපියක් සම්මුඛ පරීක්ෂණයේදී අනිවාර්යෙන් ඉදිරිපත් කළ යුතුය.
(අඛණ්ඩව මාස 12ක් සම්පූර්ණ කල සේවා කාලය සඳහා පමණක් වර්ෂයකට හිමි ලකුණු ප්‍රමාණය ලබා දෙනු ලැබේ)

ii. සහකාර හා නියෝජ්‍ය විදුහල්පති තනතුරු සඳහා වැඩ බැලීමට හෝ රාජකාරී ආවරණයට පත් කර ඇති නිලධාරීන් සඳහා මේ යටතේ ලකුණු හිමි නොවේ.

**2.** 2022.01.26 දිනට පූර්වාසන්න වසර 5ක කාලය තුළ දුෂ්කර සේවා කාලය වසරකට ලකුණු 06 බැගින් උපරිමය වසර 05 (අඛණ්ඩව මාස 12ක් සම්පූර්ණ කල සේවා කාලය සඳහා පමණක් වර්ෂයකට හිමි ලකුණු ප්‍රමාණය ලබා දිය යුතුය) 30

මගේ අංක ED/3/37/9/2/3(i) හා 2005.01.18 දිනැති දාතමින් නිකුත් කර ඇති 2005/01 අංක දරණ " **ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන හා ජාතික ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාව සඳහා පහසුකම් පාදක පාසල් වර්ගීකරණය**" චක්‍රලේඛයට අනුව හා අංක ED/3/37/9/31 හා 2006.11.24 දාතමින් නිකුත් කර ඇති 2006/43 අංක දරණ"**දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශවල පිහිටි පාසල්වල ගුරු හිඟය පියවීම සඳහා ගුරුවරුන් බෙදාහැරීම දිරිගැන්වීම පිණිස මූල්‍යමය දිරිදීමනාවක් ලබා දීම සඳහා පාසල් දුෂ්කර සහ අති දුෂ්කර ලෙස වර්ග කිරීම**" යන මැයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛයට අනුව පළාත් බලධාරීන් විසින් හඳුනා ගන්නා ලද දුෂ්කර පාසල් ලේඛන අනුව අති දුෂ්කර හා දුෂ්කර පාසල් වල සේවය කරනු ලබන වැඩ බලන /රාජකාරී ආවරණ විදුහල්පතිවරුන්ට සහ ගුරුවරුන්ට මෙම ලකුණු ලබා දෙනු ලැබේ.

**3.** පශ්චාත් උපාධිය (උපරිම ලකුණු 15) 15
(අධ්‍යාපන හෝ කළමනාකරණ විෂය ක්ෂේත්‍රයකින් ලබාගත් පශ්චාත් උපාධියකට පමණක් මෙම ලකුණු හිමිවේ.)

**4.** අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ වූ පර්යේෂණ / නිබන්ධන/ ප්‍රකාශන/ව්‍යාපෘති ඉදිරිපත් කිරීම. (උපරිම ලකුණු 10) 10

4.1 පර්යේෂණ- (එක් පර්යේෂණයකට ලකුණු 3 බැගින් උපරිම පර්යේෂණ 02ක් සඳහා) (පශ්චාත් උපාධියට /පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ඉදිරිපත් කරන ලද නිබන්ධනයට අදාළ පර්යේෂණ /නිබන්ධන සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ)

4.2 ප්‍රකාශන හෝ ව්‍යාපෘති- (එක් ප්‍රකාශනයකට/ව්‍යාපෘතියකට ලකුණු 2 බැගින් උපරිම ප්‍රකාශන හෝ ව්‍යාපෘති 02ක් සඳහා )

<u>සටහන</u>

I. පෙළපොත් හා ඒ ආශ්‍රිත ග්‍රන්ථ සඳහා ලකුණු ලබා දෙනු නොලබන අතර , **අධ්‍යාපන ග්‍රන්ථ ප්‍රකාශන උපදේශක මණ්ඩලය** විසින් අනුමත කරන ලද ප්‍රකාශන සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

II. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළව ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සඳහා පමණක් ලකුණු ලබා දෙන අතර ඒ සඳහා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කරන ලද ලිපියක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

**5.** ඉංග්‍රීසි භාෂා නිපුණතාවය (උපරිම ලකුණු 05) 05

5.1 ඉංග්‍රීසි ඩිප්ලෝමාවක් හදාරා ලබා ගත් සහතිකයක් හෝ ඊට ඉහළ සුදුසුකමක් (ඩිප්ලෝමාවට අදාල කාලසීමාව මාස 06ක් හෝ ඊට වැඩි විය යුතුයි.) (ලකුණු 05)

5.2 ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (සහතික පත්‍ර පාඨමාලාව අදාල කාලසීමාවට මාස 03 ක් හෝ ඊට වැඩි විය යුතුය) (ලකුණු 03)

5.3 ඉංග්‍රීසි භාෂා නිපුණතාවය සඳහා මාස 1 සිට 3 තෙක් හදාරා ලබා ගත් සහතිකය (ලකුණු 02)

<u>සටහන</u>

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් හෝ ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමනු ලබන සහතික සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

II. ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා ලකුණු හිමි වන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

III. සහතික පත්‍රවල කාල සීමාව තහවුරු කිරීමට අදාල ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**6.** තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ දැනුම (උපරිම ලකුණු 05) 05

6.1 තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාවක් හදාරා ලබා ගත් සහතිකයක් හෝ ඊට ඉහළ සුදුසුකමක් (ඩිප්ලෝමාවට අදාල කාලසීමාව මාස 06ක් හෝ ඊට වැඩි විය යුතුය) (ලකුණු 05)

6.2 තොරතුරු තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා ලබා ගත් සහතිකය (සහතික පත්‍ර පාඨමාලාව අදාල කාලසීමාවට මාස 03ක් හෝ ඊට වැඩි විය යුතුය) (ලකුණු 03)

<u>සටහන</u>

I. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් උපාධි ප්‍රදානය කරන ආයතනයකින් හෝ ශ්‍රී ලංකා තෘතීය හා වෘත්තීය පුහුණු කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ආයතන මගින් පිරිනමනු ලබන සහතික සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

II. ලබා ඇති ඉහළම සුදුසුකම සඳහා ලකුණු හිමි වන පරිදි එක් සහතිකයකට පමණක් ලකුණු ලබා දෙනු ලැබේ.

III. සහතික පත්‍රවල කාල සීමාව තහවුරු කිරීමට අදාල ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**7.** 2016, 2017, 2018, 2019, 2020 වසර 05 තුළ ඉතිරි කර ගත් නිවාඩු , 10
(ඉහත එක් වර්ෂයක ඉතිරි කර ගත් නිවාඩු 05ක් හෝ ඊට වැඩි නම්, වර්ෂයකට උපරිම ලකුණු 02 බැගින් උපරිම ලකුණු 10)
විදුහල්පති හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කරන ලද ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**8.** පාසලේ සංවර්ධනයට සෘජු දායකත්වය තහවුරු කිරීම 06
(ශ්‍රමදාන/ප්‍රතිඵල සංවර්ධනය/ප්‍රදර්ශන/විනය කමිටු/විෂය සමගාමී සහ වෙනත් ජයග්‍රහණ) එක කරුණකට ලකුණු 02 බැගින් උපරිම කරුණු 03ක් සඳහා ලකුණු දෙනු ලැබේ.

<u>සටහන</u>

I. විදුහල්පති විසින් නිර්දේශ කරන ලද හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
II. වැඩ බලන / රාජකාරි ආවරණය කරනු ලබන විදුහල්පතිවරුන් ඉහත අංක 8හි සඳහන් කරුණු තහවුරු කරන ලේඛණ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් සහතික කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**9.** ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියට අමතරව පාසලේ සිසු දරුවන්ගේ විභව්‍යතා 09
සංවර්ධනයට විවිධ අංශ වලින් කරන ලද සේවාවන්/දායකත්වය/ශිෂ්‍ය සංගම්/සමිති වගකීම් දැරීම/ පුහුණු කටයුතු
(එක කරුණකට ලකුණු 03 බැගින් උපරිම කරුණු 03ක් සඳහා ලකුණු දෙනු ලැබේ)
<u>සටහන</u>

I. විදුහල්පති විසින් නිර්දේශ කරන ලද හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සහතික කළ ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.
II. වැඩ බලන / රාජකාරි ආවරණය කරනු ලබන විදුහල්පතිවරුන් ඉහත අංක 9 හි සඳහන් කරුණු තහවුරු කරන ලේඛන කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් සහතික කර සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**10.** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීමේදී දක්වන කුසලතාවය 25
කාර්ය භාරයට අදාළ මාතෘකාවක් ඔස්සේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය.
ඒ සඳහා පහත නිර්ණායක යටතේ ලකුණු 25ක් ලබා දෙනු ලැබේ.

| | නිර්ණායක | ලකුණු |
|---|---|---|
| 1 | හැඳින්වීම | 04 |
| 2 | ඉදිරිපත් කිරීමේ සැලැස්ම | 04 |
| 3 | ඉදිරිපත් කිරීමේ කුසලතාවය | 08 |
| 4 | විෂයය දැනුම | 05 |
| 5 | කාල කළමනාකරණය | 04 |

ලකුණුවල මුළු එකතුව <u>150</u>

(ii) අංක අමප/21/0320/308/016 හා 2021.03.01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමවේදය:

a) අදාළ පළාතේ ඇති ජාතික හා පළාත් පාසල්වල ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පවතින පුරප්පාඩු, එම පළාතට ඉල්ලුම් කර ඇති නිලධාරීන්ගෙන්ම පිරවීමට කටයුතු කරනු ලැබේ.

b) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේදී අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය අනුව සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් ඉහළම ලකුණු ලබා ගත් නිලධාරීන් පළාත් කඩඉම් ලකුණු පදනම්ව මාධ්‍ය වශයෙන් වෙන් වෙන්ව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

c) වැඩ බැලීමේ පදනම මත හෝ රාජකාරී ආවරණ පදනම මත ලකුණු ලබා ගන්නා වැඩ බලන/ රාජකාරී ආවරණ විදුහල්පතිවරුන් හා දුෂ්කර පදනම මත ලකුණු ලබා ගන්නා ගුරුවරුන් විදුහල්පති සේවයට පත්වුවහොත් එම නිලධාරීන් දුෂ්කර ප්‍රදේශවල පාසල්වල පවතින විදුහල්පති සේවයේ පුරප්පාඩු සඳහා පත්කිරීමට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

d) ඉහත c ඡේදයේ සඳහන් නිලධාරීන් ස්ථාන ගත කරනු ලබන පාසලෙහි වසර 03ක සේවා කාලයක් අනිවාර්යෙන් සේවය කළ යුතු අතර එම අනිවාර්යය සේවා කාලයෙන් පසුව ඒ හා සමාන පාසල් අතර ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ.

09. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

9.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. එක් අවුරුද්දක වැඩ බැලීමේ පදනම මත පත් කරනු ලැබේ.

9.2 ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ 11 වැනි පරිච්ඡේදයේ 12.1 හා 12.6 සිට 12.12 වගන්තිද, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටි රීතිද, අදාළ වේ.

9.3 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III වන ශ්‍රේණියට පත්වී වසර 03 කට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය.

9.4 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 අනුව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතා මට්ටම, පත්වීමේ දින සිට වසර 03ක් ඇතුලත ලබා ගත යුතු වේ. සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර තුන (03) ක් ඇතුලත ලබා ගත යුතුය. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 08/2020 අනුව එහි සඳහන් සුදුසුකම් සහිත නිලධාරීන් සන්ධාන භාෂාව සමත් වීමේ අවශ්‍යතාව සම්පූර්ණ කළ නිලධාරීන් ලෙස සලකනු ලබන අතර සෙසු නිලධාරීන් ශ්‍රී ලංකා විදුහල්පති සේවය සඳහා වූ ඉංග්‍රීසි භාෂා පරීක්ෂණයට පෙනී සිට අවම වශයෙන් 40% ක් ලකුණු ලබා ගත යුතුය.

9.5 ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ පත්වීම් ලිපිය භාර ගත්ත ද ඒ අනුව ලබා දෙන ස්ථානගත කිරීම අනුව රාජකාරී භාර නොගන්නේ නම් එම පත්වීම අවලංගු කර එම නිලධාරීන් නැවත ගුරු සේවයට යැවීමට කටයුතු කරනු ලැබේ.

10. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ පිළිබඳව හා මෙම පුරප්පාඩු පිරවීම සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව හා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් තීරණය කරනු ඇත.

11. සිංහල හා දෙමළ භාෂා වලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සලකා කටයුතු කරනු ලැබේ.

මහාචාර්ය කේ. කපිල සී.කේ.පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය